# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,273 - 2022 මාර්තු මස 25 වැනි සිකුරාදා - 2022.03.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

### තනතුරු - ඇබෑර්තු

**රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය (G.O.B.A.)**
**''ලේකම් හා ගණකාධිකාරී''තනතුර සඳහා අයදුම්පත් කැඳවීම**

1971 අංක 27 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාපිත රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමයේ ප්‍රධාන පරිපාලන නිලධාරී වන ''ලේකම් හා ගණකාධිකාරී'' තනතුර උක්ත පනතේ 11 වගන්තිය අනුව රාජ්‍ය නිලධාරියකු විසින් දැරිය යුතුය. දැනට පුරප්පාඩු වී පවතින උක්ත තනතුර සඳහා සම්මත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පහත විස්තර දැක්වෙන සුදුසුකම් සහිත රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(කරුණාකර රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් නොවන පෞද්ගලික අංශයේ සේවයේ නියුතු පුද්ගලයන් අයදුම් කිරීමෙන් වළකින්න.)

1. **සුදුසුකම්**

1. 1 ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ හෝ, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ නිලධාරියෙකු වීම හෝ, ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවයේ නිලධාරියෙකු වීම

හෝ,

1.2 කළමණාකරණ සේවා නිලධාරී සේවයේ අධි පන්තියේ නිලධාරියෙකු වීම හෝ කළමණාකරණ සේවා නිලධාරී සේවයේ I පන්තියේ නිලධාරියෙකු වීම හා වසර 05ක පළපුරුද්ද සහිත ව්‍යාපාර කළමනාකරණ/ වානිජ්‍ය විද්‍යා උපාධි හෝ සමාන සුදුසුකම් සහිත වීම.

2. රාජ්‍ය සේවා හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතී 142 සමඟ කියවිය යුතු 143 වන රීතිය අනුව හා/ හෝ (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි) අයදුම්කරු ද්වීතියන පදනම යටතේ සංගමයේ සේවයට වර්ෂ 2ක කාලයක් සඳහා මුදා හැරිය හැකි බවට ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයක් ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කර තිබිය යුතුය. (ඔබගේ අවධානය රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2020 යොමු කරවමි. එහි සඳහන් පරිදි සංගමයේ සේවය කරන කාලය සඳහා අයදුම්කරුගේ ස්ථිර තනතුරට හිමි වැටුපෙන් 25% කට සමාන වන මුදලක් සංගමයෙන් අයදුම්කරුගේ විශ්‍රාම වැටුප් හිමිකම ආරක්ෂා කිරීම සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවනු ලබන බව සහතික කරන අතර නියමිත % අනුව අයදුම්කරුගේ වැටුපෙන් වැන්දඹු අනත්දරු දායක අරමුදල් අය කර ප්‍රේෂණය කිරීමට ක්‍රියා කරන බව ද සහතික කරමි. ඊට අතිරේකව රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති 143 අනුව පරිශිෂ්ට 11 සම්පූර්ණ කර ඉදිරිපත් කර තිබිය යුතුය.

3. **තනතුරට හිමි ප්‍රතිලාභ :**

3.1 රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ දී ලබාගත් සම්පූර්ණ වැටුප නොඅඩුව (සංගමයේ සේවා කාලය තුළ යෙදෙන වැටුප් වර්ධක ලබා ගැනීම සඳහා සකස්කර ඉදිරිපත් කරනු ලබන කාර්ය සාධන ඇගයීම් වාර්තාවට පත්වීම් බලධාරියාගේ/ අවසන් වරට සේවය කළ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබීමෙන් පසුව ගෙවීම් කරනු ලැබේ.)
3.2 ප්‍රවාහන දීමනා හැර තනතුරට හිමි දීමනා
3.3 තනතුරට නියමිත වැටුප් ක්‍රමයේ උපයාගෙන ඇති/පිහිටුවා ඇති මූලික වැටුපෙන් 50% අතිරේක දීමනාවක්.
3.4 රාජ්‍ය සේවයේ හිමි නිවාඩු වලින් ලබානොගත් නිවාඩු සඳහා ඊළඟ වර්ෂය ආරම්භයේදී දීමනා
3.5 මහා සභාවේ එකඟතාවය මත එක් ලිත් මසක මූලික වැටුපට සමාන ප්‍රසාද දීමනා (වෙනස් විය හැක.)

4. **පොදු කොන්දේසි:**

4.1 කොළඹ නගරයේ සිට කිලෝමීටර 35ක් තුළ ස්ථිර පදිංචි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ඇත.
4.2 අයදුම්පත් කැඳවන 2022 මාර්තු මස 25 දිනට වයස අවු. 50 නොවැඩි වීම.
4.3 රාජ්‍ය සේවයේ අවු. 15කට නොඅඩු සේවා කාලයක්
4.4 ගිණුම් කටයුතු පිළිබඳ වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ඇත.
4.5 පරිගණක සාක්ෂරතාවය හා Internet හා E - mail භාවිතා කිරීමේ හැකියාව
4.6 සිංහල භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව

5. **විශේෂ:**

ඔබගේ පහසු පරිහරණය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2020, සංගමයේ වෙබ් අඩවියේ භාගත කිරීම් යටතේ ඇතුලත් කර ඇත.

**2022 අප්‍රේල් මස 26 වැනි අඟහරුවාදා දින මධ්‍යහ්න 12.00ට** පෙර ලැබෙන සේ ඔබගේ ජීව දත්ත හා සහතික ඇතුළත්ව සකස් කරගත් ඉල්ලුම් පත්‍රයක් දෙපාර්තමේන්තු ප්‍රධානි මගින් (ඉහත 2 වන ඡේදයේ සඳහන් සහතික හා පරිශිෂ්ඨය සමඟ) පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතුය.

එන්. එම්. විජේරත්න,
සභාපති.

2022 මාර්තු මස 25 වැනි දින,
රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය,
අංක 65/1, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.
දුරකථන අංකය :-011- 2334598, 2473633
වෙබ් අංකය:-WWW. goba. lk

03 - 282

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය)
රෙජිස්ට්‍රාර් තනතුරු — ගම්පහ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාග යෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2022 අප්‍රේල් මස 25 වැනි දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

පී. එස්. පී. අබේගුණවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2022 මාර්තු මස 02 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගම්පහ | ගම්පහ | බටහිර සියනෑ කෝරළය කොට්ඨාසයේ අළුත්ගම ප්‍රදේශයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ. |
| ගම්පහ | දොම්පෙ | නැගෙනහිර සියනෑ කෝරළය කොට්ඨාසයේ රදාවාන ප්‍රදේශයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ. |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 අප්‍රේල් මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 අප්‍රේල් මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''*

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත හැක.

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගම්පහ | දොම්පෙ | වෙල්ගම කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා නැගෙනහිර සියනෑ කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ. |
| ගම්පහ | දොම්පෙ | නැගෙනහිර සියනෑ කෝරළය කොට්ඨාසයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ. |
| ගම්පහ | මීගමුව | උතුරු අළුත්කුරු කෝරළය කොට්ඨාසයේ මීගමුව නගරය විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ. |

03-287

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය)
රෙජිස්ට්‍රාර් තනතුරු — කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාග යෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2022 අප්‍රේල් මස 25 වැනි දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2022 මාර්තු මස 02 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කළුතර | ඉංගිරිය | ඉංගිරිය/කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ රයිගම් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර. |
| කළුතර | හොරණ | රයිගම කෝරළය කොට්ඨාසයේ කුළුපන ප්‍රදේශයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර. |
| කළුතර | හොරණ | දඹර කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ රයිගම් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර. |
| කළුතර | බේරුවල | කළුතර හා පානදුර තොටමුණ කොට්ඨාසයේ බේරුවල ප්‍රදේශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර. |
| කළුතර | බේරුවල | අලුත්ගම මාලවන්බද්ද කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ කළුතර හා පානදුර තොටමුණ කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර. |

03-288

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ජනමාධ්‍ය අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**

**රැකියා සුලභ මුද්‍රණ සහ ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයට පිවිසෙන්න**

ISO තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2022**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටි මීඩියා ක්ෂේත්‍රයේ නිපුණයෙකු වන්න.
**පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ පාඨමාලාව**
**NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)**

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරවීම ඇතුලු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

කාලය : මාස 14 යි (පූර්ණ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000/-

**මයික්‍රොසොෆ්ට් ඔෆිස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර පරිගණක භාවිතය පිළිබඳවද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

කාලය : මාස 5 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000/-

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුමද, පුහුණුවද ලබා දේ.

කාලය : මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 22,000/-
NVQ සහතිකපත් පාඨමාලාව රු.31,000/-

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting and Desktop Publishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස් වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

කාලය : මාස 6 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000/-

**වෙබ් අඩවි නිර්මාණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨාමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

කාලය : මාස 05 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000/-

**පොත් බැඳීම හා නිමාකරණය - Book Binding & inishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක් න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව තුළින් ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයකි.

කාලය : මාස 08 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000/-

**අරේඛීය සංස්කරණය - Non Linear Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන හා චිත්‍රපට කර්මාන්තයේ නිරත වූවන් හට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

කාලය : මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 26,000/-

**ත්‍රිමාණ සජීවීකරණය - Digital Animation**

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප, නිර්මාණකරනය කිරීම හා එම රූප රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

කාලය : මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 25,000/-

**පරිගණක දෘඩාංග එකලස් කිරීම සහ සැකසීම - Computer Hardware & PC Assembly**

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳ මනා දැනුමක් සහ අවබෝධයක් ලබා දෙන අතර එදිනෙදා පැනගින දෘඩාංග/මෘදුකාංග වලට අදාළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට මහත් සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. නවකයන්ට මෙන්ම පරිගණක තාක්ෂණයේ නියැලි පුද්ගලයන්ටද මෙම පාඨමාලාව එකසේ ප්‍රයෝජනවත් වනු ඇත.

කාලය : මාස 04(අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු.19,000/-

**ඕෆ්සෙට් ලිතෝකරණය - Sheetfed Offset Printing**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය සහ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳව පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුලත්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 26,000/-

**නවීන වර්ණ 4 මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව**
**Modern Four Colour Offset Printing MachineOperation**

මෙම පාඨමාලාවේ අරමුණ වනුයේ නවීනතම සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳව පුළුල් වපසරියක පුහුණුවක් ලබා දී ඒ තුළින් යන්ත්‍ර ස්වාධීනව ක්‍රියාකරවීමට සහ තත්වයෙන් උසස් ගුණාත්මක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සහභාගීවන්නවුන් පුහුණු කිරීමය. සියලුම පුහුණුකරුවන්ට නවීනතම 2018 වර්ෂයේ නිෂ්පාදිත Heidelberg Speed Master Offset මුද්‍රණ යන්ත්‍රයක පුහුණුව ලබා දේ. විදෙස්ගත රැකියා සඳහා යොමුවන මුද්‍රණ කරුවන්ට මෙම පාඨමාලාව මහත් ඵලදායි පුහුණුවකි.

පාඨමාලා කාලය : මාස 03යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 30,000/-

**ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course on Digital Printing Technology**

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ නවීනතම මුද්‍රණ තාක්ෂණය වන ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දී ඒ තුළින් එම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය පුළුල් තාක්ෂණික/ප්‍රායෝගික පුහුණුව සහ අවබෝධය ලබා දීමය.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000/-

**මුද්‍රණය සඳහා ග්‍රැෆික්ස් නිර්මාණ සැකසුම - Design for Print**

මුද්‍රණ රටා නිර්මාණකරණයේ දී ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටළු මෙන්ම රටා නිර්මාණකරණ සංකල්ප පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් මේ තුළින් ලබාදේ. පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණ ජාත්‍යන්තර මට්ටමට නිර්මාණය කර ඒවා මුද්‍රණයට සුදුසු ලෙස සකසන අයුරු මෙම පාඨමාලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ.

කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 17,000/-

**ග්‍රැෆික් ඩිසයින් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Graphic Design**

මෙම පාඨමාලාව මගින් ග්‍රැෆික් නිර්මාණකරණය, කළමනාකරණය සහ මෘදුකාංග ඇතුළුව නිර්මාණ සංකල්ප සහ යෙදීම් පිළිබඳ උසස් මට්ටමේ ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාළ මෘදුකාංග භාවිතයෙන් සාර්ථක නිර්මාණ බිහි කිරීමේ නිපුණතාවයන් වර්ධනය වන අයුරින් මෙම විෂය මාලාව සකස් කර ඇති අතර මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔබට පරිපූර්ණ ග්‍රැෆික් නිර්මාණකරුවෙකු විය හැක.

කාලය : වසර 1 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 50,000/-

**මුද්‍රණ ඇසුරුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Print Packaging Technology**

මෙම පාඨමාලාව තුළින් ඇසුරුම්කරණය පිළිබඳ මුල සිට අග දක්වා විස්තරාත්මකව දැනුම සහ පුහුණුව ලබා දේ. දැනුම පුළුල් වන අයුරින් ඇසුරුම් ආයතනවලට පුහුණුකරුවන් රැගෙන ගොස් විශේෂ දේශන පැවැත්වීම ද, මෙම පාඨමාලාව අන්තර්ගතය තුළ සකසා ඇත. මෙම පාඨමාලාව ඇසුරුම්කරණ ආයතනවල නියැළි පුද්ගලයන්ට මෙන්ම මෙම ක්ෂේත්‍රයට උනන්දුවන නවකයන්ට ද සුදුසු අයුරින් සරලව අන්තර්ගතය සකස් කර ඇත.

කාලය : වසර 1 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 40,750/-

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂෙත්‍රයේ රැකියාවලට ගැලපෙන අයුරින් සකස්කොට ඇති අතර පාඨමාලා සාර්ථකව නිමකරණ සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,

අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
දුරකථන : 0112686162, 0112679791
, 0719716655
ෆැක්ස් : 011 2686162
ඊමේල් : sliopdir@sltnet.lk
වෙබ් අඩවිය : www.sliop.edu.lk

ශාඛා : ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මාතලේ.
දුරකථන : 0662222172, 071 0554298.

03-286

---

**සංශෝධනය කිරීමයි**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරඟ විභාගය - 2018 (2021)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2231 හා 2021.06.04 දිනැති *ගැසට් පත්‍රයෙන්* ප්‍රසිද්ධියට පත්කර ඇති හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2241 හා 2021.08.13 දිනැති *ගැසට් පත්‍රයෙන්* ද සංශෝධනය කරනු ලැබූ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරඟ විභාගය - 2018 (2021) බඳවා ගැනීමේ නිවේදනය සඳහා පහත සංශෝධනයන් ඇතුළත් කරනු ලබන අතර, එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

| *අනු අංකය* | *පුරප්පාඩු වූ තනතුරු අයත් දෙපාර්තමේන්තුව* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *සංකේත අංකය* |
|---|---|---|---|---|
| 05 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | සහකාර පස් රසඥ | 01 | 08 |
| 06 | මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව | මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා සහකාර අධ්‍යක්ෂ | 01 | 16 |

අ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය - **2022.04.18** දින වේ.

04. අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :-

| *අනු අංකය* | *දෙපාර්තමේන්තුව* | *තනතුරු නාමය* | *සුදුසුකම* |
|---|---|---|---|
| 06 | මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව | මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා සහකාර අධ්‍යක්ෂ | අධ්‍යාපන සුදුසුකම්:<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් භෞතික විද්‍යාව විෂය සහිතව විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.<br>*සහ*<br>*පළපුරුද්ද*<br>(අ)<br>(i) මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මිනුම් විද්‍යා පර්යේෂණ නිලධාරියෙකු වීම.<br>(ii) අදාළ තනතුරේ වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>(iii) සුදුසුකම් සලකා බලන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br>*හෝ*<br>(ආ)<br>(i) මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් මිනුම් විමර්ෂන සහකාරවරයෙකු වීම.<br>(ii) අදාළ තනතුරේ වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>(iii) සුදුසුකම් සලකා බලන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br>*හෝ*<br>(ඇ)<br>(i) සහකාර මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධිකාරීවරයකු වීම.<br>(ii) මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂකයකු ලෙස සේවා කාලය ද ඇතුළත්ව වසර පහක(5) සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>(iii) සුදුසුකම් සලකා බලන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br>*හෝ*<br>(ඈ)<br>(i) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂකයකු හෝ රසායනාගාර සහකාරවරයෙකු වීම.<br>ii. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියේ වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>iii. සුදුසුකම් සලකා බලන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br>*හෝ*<br>(ඉ)<br>i. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂකයකු වීම.<br>ii. සුදුසුකම් සලකා බලන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |

12. උක්ත බඳවා ගැනීමට අදාළව ප්‍රසිද්ධ කර ඇති සියලු පුරප්පාඩු පිරවීම හෝ කොටසක් පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

03-332

---

**අංක 2,272 - 2022 මාර්තු මස 18 වැනි සිකුරාදා දින ගැසට් පත්‍රයේ පළ වූ දැන්වීම්**

---

# I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

## බඩු බාහිරාදිය විකිණීම්

**අධිකාරි කාර්යාලය, මධ්‍ය තැපැල් හුවමාරුව, කොළඹ 10**

බඩු බාහිරාදිය වෙන්දේසියේ විකිණීම - 2022

ආපසු ලැබුණු ලියුම් කාර්යාලයට ලැබුණු හිමිකම් නොපෑ පහත සඳහන් භාණ්ඩ **2022 මාර්තු මස 30 සහ 31 යන දිනයන් හි පෙ. ව. 9.00** පැයට කොළඹ - 10 ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි නව මධ්‍ය තැපැල් හුවමාරු සංකීර්ණයේ දී ප්‍රසිද්ධියේ විකුණනු ලැබේ.

සාධාරණ මිලට ඉල්ලුම් නොකරන භාණ්ඩ විකිණීම අත්හිටුවනු ලැබේ. මිලදී ගත් අය විසින් වහාම එහි වටිනාකම මුදලින් ගෙවා කාර්යාලය වැසීමට ප්‍රථම එකී භාණ්ඩ එදිනම ඉවත්කර ගත යුතුය. එදිනට එසේ ඉවත්කර නොග න්නා භාණ්ඩ පිළිබඳව තැපැල් දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ. ප්‍රසිද්ධ වෙන්දේසියේ දී වරක් අලෙවි කරන ලද භාණ්ඩ කිසිම හේතුවක් නිසා ආපසු භාරගනු නොලැබේ.

වෙන්දේසියට අදාළව පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වන අතර පූර්ව දැනුම් දීමකින් තොරව වෙන්දේසියට තබා ඇති භාණ්ඩ එයින් ඉවත් කර ගැනීමටද ඉඩ ඇත.

අධිකාරි,
මධ්‍යම තැපැල් හුවමාරුව,
(පෝස්ට් මාස්ටර් ජනරාල් වෙනුවට)

2022 මාර්තු මස 08 වැනි දින,

**ආපසු ලැබුණු ලිපි, කාර්යාල භාණ්ඩ වෙන්දේසි ලැයිස්තුව - 2022 මාර්තු**

| | | | |
|---|---|---|---|
| 1. | රැවුල/කොණ්ඩය කොට කරන යන්ත්‍ර - Wetty Pro | | 01 |
| 2. | විදුලි පහන් | | 03 |
| 3. | ළමා අයිතමන් | | |
| | Mini robot with touch control | 01 | |
| | Building box | 01 Pack | |
| | Toy | 01 | |
| | Magic tracks | 02 Box | |
| | Art Set (Set of colors) | 01 | |
| 4. | කාන්තා ඇඟලුම් - (උඩු ඇඳුම් 02, කලිසම් 01, සාය 01) | | 04 |
| | කාන්තා පසුම්බිය | | 05 |
| | කාන්තා අත්බෑග් | | 01 |
| | කාන්තා සපත්තු - ප්‍රමාණය 37 සහ 38 | | යුගල 02 |
| 5. | ජංගම දුරකථනවලට අදාළ විද්‍යුත් උපාංග සහ උපකරණ | | 17 |
| | Bluetooth hands - free covers (Air pods) | 01 Lot | |
| | Tempered glass for galaxy S9 plus - Baseus | 05 | |
| | Bluetooth hands - free | 06 | |
| | Tempered glass - Anti burst glass protector | 05 | |
| 6. | විදුලි සහ විද්‍යුත් උපාංග | | 05 |
| | Bluetooth CD boom box - Bush CD 78B - BTFM | 01 | |
| | Portable wireless speaker - JABRA SOLEMATE MINI | 01 | |
| | Wireless speaker and alarm clock | 01 | |
| | Desktop water cooling fan | 01 | |
| | LCD Clock | 01 | |
| 7. | බුමුතුරුණු - පාවිච්චි කරන ලද (130 cm x 200 cm) | | 01 |

8. ආරක්ෂක බඳපටි 20
ඉන බඳපටි 03
බඳපටි 01
බැනියම් (ටී ෂර්ට්) 02
මුදල් පසුම්බියන් - පිරිමි 06
හිස් වැසුම් 05
බෑග් - කරපටි පලුදු වී ඇත 01

9. බැනියම් (ටී ෂර්ට්) 02
කාන්තා ඇඳුම් 04
මේස ඇතිරිලි 01
ක්‍රීඩා සපත්තු - ප්‍රමාණය 37 යුගල 01

10. නාන කාමර උපාංග - තුවායන් දමන රේගල 04

11. ළමා අයිතමයන් 04
International dota 2 championship medal 01
Cartoon hero's kit - Marvel 02
Dual charging station LED indicator 01

12. ළමා අයිතමයන් සහ ලිපි ද්‍රව්‍ය අයිතමයන් තොග 01
ළමා අත් ඔරලෝසු 03

13. සැහැල්ලු සෙල්ලම් බඩු 06
ඇඳුම් 15
පාවහන් වේලන යන්ත්‍ර 01
ළමා කොට්ට 01
ළමා ඇඳුම් 04

14. මුළුතැන්ගෙයි උපකරණ 13
Portable blender - Blend Jet 01
Aluminium mincer - TAIBAO CCCP 4025 - 83 01
Kitchen towels 06
Cloth bag 01
Touch soap dispenser 01 Pack
Kitchen Scale 01
Ice cream rubber mold 01
Rolling pin 01

15. විද්‍යුත් ශක්ති ගබඩා කරන උපකරණ - 5000 mah (Power Bank) 01

16. රෙදි බිත්ති සැරසිලි 02
විසිතුරු ගෙල මාල 01
පිඟන් මැටි වලින් තැනූ අයිතම කට්ටල 01
කුඩා තෑගි භාණ්ඩ 02
අත් පංකා 01
වීදුරු විසිතුරු අයිතමයන් 02
ප්ලාස්ටික් වතුර බෝතල් 03
කෙස් ඉවත් කරන යන්ත්‍ර Flawless Legs 01
කාන්තා මුදල් පසුම්බි 04

17. විසිතුරු අත් ඔරලෝසු 90

18. ඇඟලුම් - (සාය 21, ගවුම් 01) 22
බෑගයන් 02

19. බැනියම් (ටී ෂර්ට්) 09
කබාය සහ කලිසම 01
බ්ලැන්කට්ටු 01
පිරිමි පාවහන් යුගල 01

20. ළමා ඇඳුම් 10
ළමා ස්නාන හිස් වැසුම් ආවරණ 10
ළමා අයිතමයන් පෙට්ටි 02
කාඩ් ක්‍රීඩා කට්ටල 01
ළමා පාවහන් යුගල 03

21. ලීවලින් තනන ලද වෙස් මුහුණු 01
කඳු නැඟීමට පාවිච්චි කරන කොකු 12
විසිතුරු බිත්ති ඔරලෝසු 04
ලී වලින් තනන ලද පිළිම 01
වේවැල් වලින් තනන ලද ගබඩා පෙට්ටි - ලංකාවේ නිෂ්පාදිත 02
පොල් කටු භාජන - ලංකාවේ නිෂ්පාදිත 10

22. ඇඳුම් තොග 01
කාන්තා පාවහන් යුගල 02
කොණ්ඩා කටු පැකට් 02

23. විදුලි සහ විද්‍යුත් උපකරණ 03
Power Bank with 2 USB port 01
Power cord with USB socket 01
Convenient air cooler - Model JP-1801 01

24. ලිපි ද්‍රව්‍ය අයිතමයන් තොග 01
ළමා අයිතමයන් (සෙල්ලම්බඩු 04, කොණ්ඩා කටු - 05) 09
විදුලි දත් බුරුසු 02

25. විදුලි සහ විද්‍යුත් උපකරණ 08
USB LED table lamp 05
Portable AC - F832 BLAUX 02
Rechargeable LED tea light candle set 01

26. මුළුතැන් ගෙයි උපකරණ 05
One step precision cutting machine 01
2 - Layer dish drainer 01
Portable Juicer machine 01
Icing cake making nozzle 01 Pack
Book tape (Fabric adhesive tape) 01

27. ළමා සෙල්ලම් අයිතම (Toy boat with remote control) 01
ICL අනුමැතිය අවශ්‍ය වේ.

28. මුළුතැන්ගෙයි උපකරණ 12
Table wear 08
Multi purpose anti slip mat 01
Meat grinder - Plastic and manual operation 01
Kitchen Ware 01 Pack
Paper cups 01 Lot

29. කොණ්ඩා සැකසුම් යන්ත්‍ර (Negative iron hot electric splint) 01
කොණ්ඩා සැකසුම් යන්ත්‍ර (වෙළෙඳ නාම රහිත) 01
කුඩ 01
කුඩා ඉසින බෝතල් 30
රූපලාවන්‍ය උපකරණ - Derma roller - Model DRS 100 (1.0 mm) 08

30. ජංගම දුරකතනය උපාංග සමග - Samsung Galaxy A40 01
64GB memory, 4G RAM, 4G LTE
TRC අනුමැතිය අවශ්‍ය වේ.

31. බැනියම් (ටී ෂර්ට්) 03
ඇඟලුම් 07
තුවා රෙදි 02
පිරිමි මුදල් පසුම්බි 01
පිරිමි පාවහන් - පාවිච්චි කරන ලද යුගල 01
බේස් බෝල් හිස් වැසුම් 01

32. කැමරා - Outdoor mini speed DOME camera 01

33. සාරි 02
සල්වාරි ඇඳුම් 03

34. බැනියම් (ටී ෂර්ට්) 34

35. පරිගණක උපාංග 16
Key board - Logitech, MK270 wireless combo 01
Lap top bags 02
Mini camera 06
Web cam - Logitech C270 HD 01
OTG USB flash for smart phone & tablet 32 GB 01
SATA external hard drive enclosure - USB 3.0 to 2.5 inch 01
2.5 inch SATA HDD & SSD enclosure 01
Bluetooth speaker case 01
Power supply unit with cooling fan 01
Computer processor - Intel R core 7-4790K, SR219 4, 00 GHz 01
X518A711, Vietnam

36. මුද්‍රිත පරිපථ පුවරු - විදුලි සැපයුම් 02
Power supply board - Samsung PSLF251BO2A 01
LED/ LCD Power supply board - LG 55"55LB6300 - UQEAY63072101 01

37. ඉදිරිපත් කිරීම් ප්‍රදර්ශනය කරන තිරයන් (projection screen) 07

38. චිත්‍ර නිර්මාණ 02

39. ඇඳ වසන ඇතිරිලි (Quilterd Bed cover -5' x 7') 01

40. බ්ලැන්කට්ටු 01

41. ළමා අයිතමයන් 08
(ළමා ඇඳුම් 02, අත් ඔරලෝසු 01, පාසල් බෑග් 01, පැන්සල් කවර 01,
සෙල්ලම් හෙලිකොප්ටර් 01, රබර් ඇතිරිලි 01, සෙල්ලම් බයිසිකල් 01)
සෙල්ලම් හෙලිකොප්ටර් සඳහා ICL අනුමැතිය අවශ්‍ය වේ.

42. කුඩාරම් ප්ලාස්ටික් කවරයන් සමග 02

43. සෙල්ලම් බැකෝ යන්ත්‍ර 01

44. ලීවලින් තනන ලද අලියා 01

45. එල්ලන ඇඳ (Crua Hammock stand - Cartoon size 101x30.5x14cm) 01

46. කාන්තා ඇඟළුම් 24
කාන්තා කුඩා අත් බෑගයන් 02
සෙරෙප්පු යුගල 03

47. භාවිතා කරන ලද කුඩාරම් උපාංග සමග 01

48. විදුලි සහ විද්‍යුත් උපකරණ 04
Finger print time attendance series device - SYOA 02
Portable printer - Nilmbot, Bluetooth 01
58mm Thermal receipt printer - POS 5890K 01
මුද්‍රණ කටයුතු සඳහා තීන්ත බෝතල් 04

49. විවිධ වර්ගයේ විදුලි/ විද්‍යුත්/ පරිගණක උපාංග 71
Repeater 01
EZ track 32 memories positioner 01
Remote Control 02
Drum microphone holder 01
PCI to series adapter - Combo card 01
Sports HD DV 5Q11 mini DV camera 02
Wifi smart switch - 1CH 10A 01
Mini HDM 12V GA unit 01
Computer mouse 01
Mouse pad 01
AT - 101 Tuner 01
HD camera pens 04
Coustic light sensor - MR SKSOA 01
Mic holder 01
Push button switch 01
Hard drive case 12.7mm sata enclosure frame 02
Hard drive case 01
Cable for computer hardwear 23
Condenser mike 02 Pack
Play station wireless controler - Dualghock 4 Sony 01
3 in 1 portable game pad 01
Electronic component - D2499 09
Electronic component - HK Q 032 09
RJ 45 Jacks 01 Pack
VGA HD video cable 01

50. ජංගම දුරකථනය උපාංග සමග (Samsung Galaxy A40) 01
64 GB, 4 GB RAM
TRC අනුමැතිය අවශ්‍ය වේ.

51. ලැප්ටොප් පරිගනකය උපාංග සමග 01
Acer - Spin 3, 13 - 7TH generation

52. පරිගණක සහ ජංගම දුරකථන උපාංග 17
Wireless travel mouse - BOIKE 01
True - Wireless head set 02
True - Wireless earbuds with power bank 01
Touch mini invisible binaural earphone 01
Handsfree 03
Ear pods for apple phone 01
Wireless sport head phone 01
Handsfree pouch 05
Bluetooth speaker 01
USB to HDMI cable adapter 01

| | | | |
|---|---|---|---|
| 53. | ළමා ඇඟලුම් | | 05 |
| | පෙර පාසල් ගණිත උපකරණ | | 01 |
| | ලෙගෝ කට්ටල | | තොග 01 |
